සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

7 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමිවේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 අප බෝධිසත්වයන් වහන්සේ බුද්ධත්වයට පත්වුයේ,

(i) වෙසක් පොහොය දවසේ ය. (ii) පොසොන් පොහොය දවසේ ය.

(iii) ඇසළ පොහොය දවසේ ය. (iv) නිකිණි පොහොය දවසේ ය.

02 බුදුරජාණන් වහන්සේ අනිමිස ලෝචන පූජාව පැවැත්වූයේ කිනම් සතියේ ද?

(i) පළමු සතිය (ii) දෙවන සතිය (iii) තෙවන සතිය (iv) සිව්වන සතිය

03 පස්වග තවුසන් රහත් ඵලයට පත්වූ සූත්‍ර දේශනාව වූයේ,

(i) මංගල සූත්‍රය (ii) දම්සක්පැවතුම් සූත්‍රය

(iii) කරණීයමෙත්ත සූත්‍රය (iv) අනත්ත ලක්ඛණ සූත්‍රය

04 බුදු රජාණන් වහන්සේ පස්වග තවුසන්ට දහම් දෙසීමට සිතා බරණැස ඉසිපතනය කරා වැඩම කරන අතරමගදී හමුවූයේ,

(i) විශාඛා උපාසිකාව (ii) සුදත්ත සිටුතුමා

(iii) උපක ආජීවක (iv) උදය බමුණා

05 බුදු රජාණන් වහන්සේ පළමුවෙන්ම 'ඒහි භික්ඛු' භාවයෙන් පැවිදි කළේ,

(i) භද්දවග්ගිය කුමාරවරුන් ය. (ii) යසකුල පුත්‍රයා ඇතුළු පිරිසය.

(iii) පස්වග තවුසන් ය. (iv) තුම්බෑ ජටිලයන් ය.

- **අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරනිවැරදි පිළිතුර B තීරුවෙන් තෝරා එහි අංකය A තිරුවේ තිබෙන වරහනෙහි යොදන්න.**

| A | | | | B |
|---|---|---|---|---|
| 06 | බිම්බිසාර රජතුමා | (................) | 1. | මහියංගණ චෛත්‍යය |
| 07 | විශාඛා උපාසිකාව | (................) | 2. | උපතිස්ස, කෝලිත |
| 08 | සංජය පිරිවැජියා | (................) | 3. | පූර්වාරාමය |
| 09 | සුමන සමන් දෙවියෝ | (................) | 4. | වේළුවනාරාමය |
| 10 | අනේපිඬු සිටුතුමා | (................) | 5. | ථූපාරාමය |
| | | | 6. | ජේතවනාරාමය |

- **අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් දී ඇති වරහන තුළ යොදන්න.**

11 උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග පහක් දේශනාවේ සඳහන් වේ. (          )

12 ''අනුත්තරෝ පුරිසධම්ම සාරථී'' ගුණයෙන් අංගුලිමාල පිහිට ලද අයෙකි. (          )

13 සැරියුත් තෙරුන් ධර්ම භාණ්ඩාගාරික ලෙස තේරී පත්වූහ. (          )

14 බුදු රජාණන් වහන්සේ හයවන සතියේ කිරිපලු රුක මුල වැඩ සිටියහ. (          )

15 වෛරය අවෛරයෙන් නොසන් සිඳේ. (          )

- **අංක 16 සිට 20 දක්වා ඇති වාක්‍යවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

16 බුදු රජාණන්ද වහන්සේ .................................... සතියේ අභිධර්මය මෙනෙහි කරමින් සිටින අවස්ථාවේ ශරීරයෙන් බුදුරැස් විහිදෙන්නට පටන් ගත්හ. (සිව්වන / පස්වන)

17 බුදුරජාණන් වහන්සේ ................................................ පොහෝ දින මහියංගණ චෛත්‍ය පිහිටි ස්ථානයට අහසින් වැඩම කළහ. (දුරුතු / නවම්)

18 අත්ලෙහි වූ නෙල්ලි ගෙඩියක් මෙන් මනාව දත් හෙයින් ........................................................ ගුණයෙන් යුක්ත වන සේක. (සම්මා සම්බුද්ධ / සුගත)

19 ''සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා'' ...................................... සූත්‍රයේ සඳහන් වේ. (රතන / කරණීයමෙත්ත)

20 බුදුරජාණන් වහන්සේ වැඩිම කාලයක් වස් වාසය කළේ ................................................ විහාරයේ ය. (පූර්වාරාමය / ජේතවනාරාමය)

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, 02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමිවේ.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) දම්සප් පැවතුම් සූත්‍රය ඇසීමෙන් පළමුව සෝවාන් වූයේ කවුද?

(ii) යෝ භික්කවේ මං උපට්ඨහෙය්‍ය සෝ ගිලානං උපට්ඨහෙය්‍ය මෙම පාඨයේ තේරුම ලියන්න.

(iii) සිරිත් මල්දම පද්‍ය ග්‍රන්ථය රචනා කළේ කවුද?

(iv) ඔබ පාසලේ දී අනුගමනය කළ යුතු සිරිත් දෙකක් නම් කරන්න.

(v) මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු උසස් ගුණාංග 15 ක් කරණීයමෙත්ත සූත්‍රයේ ඇතුළත් වේ. ඉන් දෙකක් ලියන්න.

(vi) අනුසෝතගාමී හා පටිසෝතගාමී යන වචන දෙකෙහි තේරුම ලියන්න.

(vii) ධම්ම පදය අයත් නිකාය ග්‍රන්ථය නම් කරන්න.

(viii) අගසව් දෙනම නම් කරන්න.

(ix) ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ

වැඩිකොට ඇඳුමුත් ඇද නොම ගන්නේ .... කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(x) බුදු රජාණන් වහන්සේ රජගහ නුවර සිට කිඹුල්වත් පුරට වැඩම කරගෙන ඒමට මූලිකත්වය ගත් රහතන් වහන්සේ කවුද? (ලකුණු 2 x 10 = 20)

02 (i) බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලද අසරණ පිරිස් අතරින් දෙදෙනකු නම් කරන්න.

(ii) ඉන් එක් අයෙකුට පිහිට වූ අවස්ථාවක් පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න.

(iii) ඔබ අසරණ අයෙකුට පිහිට වූ අවස්ථාවක් පිළිබඳ වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 10)

03 (i) නව අරහාදි බුදු ගුණ අතරින් දෙකක් නම් කරන්න.

(ii) ඉන් එකක තේරුම ලියන්න.

(iii) බුදු ගුණ භාවනාව සිදුකරන ආකාරය ලියන්න. (ලකුණු 10)

04 (i) නිවසේ දී අනුගමනය කළයුතු සිරිත් දෙකක් නම් කරන්න.

(ii) පන්සලේ දී අනුගමනය කළයුතු සිරිත් තුනක් නම් කරන්න.

(iii) ආදර්ශමත් ශිෂ්‍යයෙකු වීමට ඔබ අනුගමනය කළයුතු සිරිත් විරිත් ලියන්න. (ලකුණු 10)

05 (i) මාතා යථා නියං පුත්තං ..... ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) එම ගාථාවේ තේරුම ලියන්න.

(iii) මෛත්‍රී භාවනාවෙන් ලැබෙන සමාජීය ප්‍රයෝජන පහක් ලියන්න. (ලකුණු 10)

06 (i) බුදු සසුනේ අග්‍රදායකයා හා දායිකාව නම් කරන්න.

(ii) එම දෙදෙනාගේ පියවරුන්ගේ නම් සඳහන් කරන්න.

(iii) ඔබගේ චරිතය හැඩගස්වා ගැනීමට මෙම චරිත දෙකෙන් ලබාගත හැකි ගුණ ධර්ම පහක් ලියන්න.

(ලකුණු 10)

07 (i) බුදුරජාණන් වහන්සේ ගිලනුන්ට උපස්ථාන කළ අවස්ථාවක් නම් කරන්න.

(ii) උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් සඳහන් කරන්න.

(iii) පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබට අසරණයන්ට පිහිට විය හැකි අවස්ථා පහක් ලියන්න. (ලකුණු 10)

| 7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය 2018 | බුද්ධ ධර්මය |
|---|---|---|

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | i | (02) | ii | (03) | iv | (04) | iii | (05) | iii | (06) | 4 | (07) | 3 | (08) | 2 |
| (09) | 1 | (10) | 6 | (11) | ✓ | (12) | ✓ | (13) | × | (14) | × | (15) | ✓ | (16) | සිව්වන |

(17) දුරුතු (18) සම්මා සම්බුද්ධ (19) කරණීයමෙත්ත සූත්‍රය (20) ජේතවනාරාම විහාරය

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01 (i) කොණ්ඩඤ්ඤ තාපස තුමා

(ii) යමෙක් මගේ වචනය පිළිපැදිමෙන් මට උපස්ථාන කරන්නේ ද? හෙතෙම ගිලනාට උපස්ථාන කරන්නේ ය.

(iii) එම්. එල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමා

(iv) පිරිසිදු නිල ඇඳුමෙන් සැරසීම / කෙස්, නියපොතු කපා පිළිවෙළකට කොණ්ඩය පීරා තිබීම (30 පිටුව බලන්න.)

(v) දක්ෂයෙකු වීම / අවංක බව / මැනවින් අවංක වීම / කීකරුකම (35 පිටුව බලන්න.)

(vi) යටිගං බලා යාමට මග පෙන්වන්නේ නැත / උඩුගං බලා යාමට මග පෙන්වන්නකි.

(vii) ඛුද්දක නිකායට

(viii) සැරියුත් තෙරුන් වහන්සේ / මුගලන් තෙරුන් වහන්සේ

(ix) ගමනට ගෙදරට එක නාදින්නේ
වයසට පමණට ඇඳුම් අඳින්නේ (27 පිටුව)

(x) කාළුදායි රහතන් වහන්සේ (ලකුණු 2 x 20 = 40)

02 (i) සුනීත / සෝපාත / රජ්ජුමාලා / පටාචාරා ආදී ලෙස

(ii) එක් අයෙකුට පිහිට වූ ආකාරය කෙටියෙන් ලියා තිබීම ප්‍රමාණවත් ය.

(iii) ශිෂ්‍ය පිළිතුර සලකා බලා ලකුණු පිරිනමන්න. (ලකුණු 10)

03 (i) අරහං / සම්මා සම්බුද්ධ / විජ්ජාචරණ සම්පන්න / සුගතෝ / ලෝකවිදූ / අනුත්තරෝ පුරිස ධම්ම සාරථී / සත්ථා දේව මනුස්සානං / බුද්ධෝ / භගවා

(ii) එකක තේරුම ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න.

(iii) බුදුගුණ භාවනාව ගැන ලියා තිබුණ ද / භාවනාව වඩන අයුරු ලියා තිබුණ ද ලකුණු දෙන්න.(ලකුණු 10)

04 (i) ශිෂ්‍ය පිළිතුරු සලකා බලන්න. (33 පිටුව බලන්න.)

(ii) ශිෂ්‍ය පිළිතුරු සලකා බලන්න. (33 පිටුව බලන්න.)

(iii) ශිෂ්‍යාගේ පිළිතුර සලකා බලා ලකුණු දෙන්න. (ලකුණු 10)

05 (i) මාතා යථා නියං පුත්තං
ආයුසා ඒක පුත්තමනුරක්ඛේ
ඒවම්පි සබ්බ භූතේසු
මානසං භාවයේ අපිරමාණං

(ii) එකම පුතෙකු ඇති මවක් දිවි හිමියෙන් එම පුතු ආරක්ෂා කරන්නේ යම්සේ ද එවැනි වූ මෛත්‍රියක් සියලු සත්වයා කෙරෙහි පැතිරවිය යුතු බව මෙයින් කියැවෙයි.

(iii) ශිෂ්‍ය පිළිතුර සලකා බලා ලකුණු දෙන්න. (ලකුණු 10)

06 (i) අණේපිඬු සිටුතුමා / විශාඛා උපාසිකාව

(ii) සුමන සිටුතුමා / ධනංජය සිටුතුමා

(iii) ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න. (ලකුණු 10)

07 (i) පූතිගත්ත තිස්ස තෙරුන්ගේ කථාව වෙනත් අදාළ එකක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.)

(ii) 1. රෝගියාට අවශ්‍ය බෙහෙත් පිළියෙල කර දීම.
2. රෝගියාට හිතකර හා අහිතකර ආදී ලෙස නිවැරදි පිළිතුරට ලකුණු දෙන්න.

(iii) ශිෂ්‍ය පිළිතුර සලකා බලා ලකුණු පිරිනමන්න. (ලකුණු 10)